# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2024 ජූලි මස 12 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2024.07.17 දින නිකුත් කරන ලදී)**


## ශ්‍රී ලංකා ක්‍රිකට් විනිසුරුවන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ)

*(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)*

**ශ්‍රී ලංකා ක්‍රිකට් විනිසුරුවන්ගේ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 18.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ශ්‍රී ලංකා ක්‍රිකට් විනිසුරුවන්ගේ සංගමය
(සංස්ථාගත කිරීමේ)

## ශ්‍රී ලංකා ක්‍රිකට් විනිසුරුවන්ගේ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"ශ්‍රී ලංකා ක්‍රිකට් විනිසුරුවන්ගේ සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන හා හඳුන්වනු ලබන සංගමයක්, එහි සාමාජිකයන් විසින් එකඟ වන ලද නීති රීතිවලට අනුකූලව, එකී සංගමය හා සම්බන්ධ සියලු කාරණා එලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා ඉටු කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද:

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා කිහිපය එකී සංගමය විසින් මේ දක්වා සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් හා ඒ සංගමය සංස්ථාගත කරනු ලැබීම පිණිස ඉල්ලීමක් කර ඇති හෙයින් ද, ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

*ලුහුඬු නාමය*

1. මේ පනත 2024 අංක    දරන ශ්‍රී ලංකා ක්‍රිකට් විනිසුරුවන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ:-

*ශ්‍රී ලංකා ක්‍රිකට් විනිසුරුවන්ගේ සංගමය සංස්ථාගත කිරීම*

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවීමේ දින සිට හා ඉන් පසුව, (මෙහි මින්මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ක්‍රිකට් විනිසුරුවන්ගේ සංගමයේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන්, (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ක්‍රිකට් විනිසුරුවන්ගේ සංගමය යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද, සියලු අධිකරණයන්හි නඩු පවරනු ලැබිය හැකි ය. තව ද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ හා පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය හා අධිකාරය සංස්ථාවට ඇත්තේ ය.

*සංස්ථාවේ පොදු පරමාර්ථ*

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:-

(අ) ක්‍රිකට් විනිසුරුවන්ගේ වෘත්තීය හා ක්‍රිකට් විනිසුරුවන් වශයෙන් සුදුසුකම් ලැබීමට අපේක්ෂා කරන තැනැත්තන්ගේ යහපත, තත්ත්වය, සුබසාධනය, අයිතිවාසිකම් හා වරප්‍රසාද ආරක්ෂා කොට ප්‍රවර්ධනය කිරීම;

(ආ) ක්‍රිකට් විනිසුරුවන් වශයෙන් සුදුසුකම් ලැබීමට අපේක්ෂා කරන තැනැත්තන් සංගමයට ඇතුළත් කර ගැනීම හා ඒ තැනැත්තන්ට වෘත්තීය පුහුණුවක් ලබා දීම සංවිධානය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම සහ ඒ තැනැත්තන් ශ්‍රේණිගත කිරීම;

(ඇ) අඛණ්ඩව පවත්වාගෙන යනු ලබන පුහුණු කිරීමේ පාඨමාලා පැවැත්වීමෙන් ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව විනිශ්චය කිරීමේ ප්‍රමිති වැඩිදියුණු කිරීම;

(ඈ) වෘත්තියෙහි උසස් ප්‍රමිති පවත්වාගෙන යනු ලබන බවට සහතික කිරීම පිණිස, ක්‍රිකට් විනිසුරුවන් වශයෙන් වෘත්තියෙහි යෙදෙන තැනැත්තන්ගේ සාමාන්‍ය ක්‍රියා පැවැත්ම හා ඔවුන්ගේ වෘත්තීය කටයුතු විධිමත් කිරීම;

(ඉ) ක්‍රීඩා අමාත්‍යාංශය, ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ආයතනය හා සංස්ථාව අනුබද්ධව ඇත්තා වූ ද, සංස්ථාවේ සම්බන්ධතාවයන්ට හා කර්තව්‍යයන්ට සමාන සම්බන්ධතාවයන්ට හා කර්තව්‍ය ඇත්තා වූ ද, ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටා ඇති සංවිධාන සමග සම්බන්ධතා පවත්වාගෙන යාම;

(ඊ) සංස්ථාවේ සාමාජිකත්වයේ විවිධ ශ්‍රේණිවලට තැනැත්තන් ඇතුළත් කර ගැනීමේ සුදුසුකම් තක්සේරු කිරීම;

(උ) දත්ත බැංකු පිහිටුවා පවත්වාගෙන යාම ද ඇතුළුව, සංස්ථාවේ සාමාජිකයන්ගේ ප්‍රතිලාභය හා වැඩිදියුණුව උදෙසා අවශ්‍ය වෙනත් යම් පියවර ගැනීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම

**4.** (1) 2 වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සංස්ථාවේ කටයුතු පරිපාලනය, කළමනාකරණය හා පාලනය, සංස්ථාවේ නීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන හෝ නම් කරනු ලබන, සභාපතිවරයකුගෙන්, උප සභාපතිවරුන්ගෙන්, ප්‍රධාන ලේකම්වරයකුගෙන්, භාණ්ඩාගාරිකවරයකුගෙන්, තරග පැවරුම් ලේකම්වරයකුගෙන්, උප ලේකම්වරයකුගෙන්,

උප භාණ්ඩාගාරිකවරයකුගෙන්, උප තරඟ පැවරුම් ලේකම්වරයකුගෙන්, මහජන සම්බන්ධතා නිලධාරියකුගෙන් හා කමිටු සාමාජිකයන්ගෙන් සමන්විත (මෙහි මින්මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) විධායක කමිටුවක් වෙත, සංස්ථාවේ නීතිවලට යටත්ව පැවරෙන්නේ ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමේ දිනයට ඉහතින් වූ දිනයේ දී ධුර දැරූ සංගමයේ විධායක කමිටුවේ සාමාජිකයන්, සංස්ථාවේ ප්‍රථම කමිටුවේ සාමාජිකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

සංස්ථාවේ බලතල

**5.** (1) මේ පනතේ හා වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන වලට යටත්ව, කමිටුවට සංස්ථාවේ නාමයෙන්, සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීමෙහි ලා හෝ සාක්ෂාත් කර ගැනීමෙහි ලා අවශ්‍ය හෝ ආනුෂංගික හෝ හිතකර සියලු ක්‍රියා හා දේ කිරීමට බලය ඇත්තේ ය.

(2) (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව කමිටුව විසින්, පහත සඳහන් බලතල ක්‍රියාත්මක කිරීම හා කර්තව්‍ය ඉටුකිරීම, කරනු ලැබිය හැකි ය:-

(අ) සංස්ථාවේ කාර්ය සඳහා යම් නිශ්චල හෝ චංචල දේපළක් අත් කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ හුවමාරු කිරීම, අන්‍යාකාරයකින් අන්සතු කිරීම, බැඳ තැබීම හෝ බැහැර කිරීම;

(ආ) සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම හෝ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සියලු ගිවිසුම්වලට හෝ එකඟවීම්වලට, කෙලින්ම හෝ සංස්ථාව විසින් තත්කාර්යය සඳහා බලය දෙනු ලැබූ යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු මගින් හෝ එළඹීම සහ ඒ ගිවිසුම් හෝ එකඟවීම් ඉටු කිරීම;

(ඇ) බැංකු ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම හා වසා දැමීම සහ සංස්ථාවේ මුදල්, කමිටුව විසින් නිශ්චය කරනු ලබන යම් සුරැකුම්පත්වල ආයෝජනය කිරීම;

(ඈ) සංස්ථාවේ කාර්ය සඳහා සහ කමිටුව විසින් සුදුසු යැයි සලකනු ලබන යම් ආකාරයකින් හා එසේ සුදුසු යැයි සලකනු ලබන යම් ඇපයක් මත, මුදල්, අත්තිකාරම් වශයෙන් හෝ ණයට දීම හා ණයට ගැනීම;

(ඉ) සාමාජිකත්වය, සාමාජිකත්වයට ඇතුළත් කර ගැනීම, සාමාජිකත්වය අලුත් කිරීම සහ සංස්ථාව විසින් පවත්වනු ලබන පාඨමාලා සම්බන්ධයෙන් ගාස්තු, සම්මාදම් මුදල් හා දායක මුදල් අය කිරීම;

(ඊ) ක්‍රිකට් ක්‍රීඩාවේ විනිසුරුවන් වශයෙන් සුදුසුකම් ලැබීමට අපේක්ෂා කරන තැනැත්තන් සඳහා නියමයන් හා කොන්දේසි නියම කිරීම සහ ඒ තැනැත්තන් යොදා ගැනීම, පුහුණු කිරීම හා සේවයෙන් පහ කිරීම පාලනය කිරීම හා විධිමත් කිරීම;

(උ) සංස්ථාවේ නිලධරයන් හා සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, මාරු කිරීම, සේවයෙන් පහ කිරීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීම සහ ඔවුන්ගේ වැටුප් පාරිතෝෂික හා දීමනා ගෙවීම;

(ඌ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය කිසිවක් ඉදි කිරීම, මිලදී ගැනීම, නඩත්තු කිරීම හා අලුත්වැඩියා කිරීම; සහ

(එ) සංස්ථාවේ පරමාර්ථ සියල්ලම හෝ ඉන් කිසිවක් ප්‍රවර්ධනය කිරීම උදෙසා අවශ්‍ය හෝ යෝග්‍ය වෙනත් සියලු පියවර ගැනීම.

සංස්ථාවේ නීති

**6** (1) සංස්ථාව විසින්, කමිටුවේ අනුමැතිය ඇතිව කලින් කල යම් මහා සභා රැස්වීමක දී හෝ විශේෂ මහා සභා රැස්වීමක දී සහ පැමිණ සිටින සහ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු වැඩි ඡන්දයෙන් පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධානවලට අනුකූල නොවන නීති සෑදීම නීත්‍යානුකූල වන්නේ යː-

(අ) කමිටුවේ නිලධාරීන්ගේ ධුර කාලය කමිටුවට සාමාජිකයන් තෝරා පත් කර ගැනීමේ දී, පත් කිරීමේ දී හෝ නම් කිරීමේ දී සුදුසුකම් හා එසේ තෝරා පත්

කර ගනු ලබන, පත් කරනු ලබන හෝ නම් කරනු ලබන අන්දම, නිලධාරින්ගේ ඉල්ලා අස්වීම හෝ ධුරය අත් හැරීම හා අනියම් පුරප්පාඩු පිරවීම කමිටුවේ බලතල හා කර්තව්‍ය පැවරීම සහ අනු කමිටු පත් කිරීම;

(ආ) කමිටුවේ නිලධාරින්ගේ බලතල, කර්තව්‍ය හා කාර්ය සහ ඔවුන්ට ගෙවිය යුතු යම් දීමනා හෝ ගාස්තු;

(ඇ) සංස්ථාවේ නිලධරයන්ගේ හා සේවකයන්ගේ ප්‍රතිලාභ සඳහා අර්ථසාධක අරමුදලක් පිහිටුවීම හා විධිමත් කිරීම සහ ඒ අරමුදලට සංස්ථාව විසින් හා ඒ නිලධරයන් හා සේවකයන් විසින් කළ යුතු දායක මුදල;

(ඇ) සංස්ථාවේ නිලධරයන්ගේ, සේවකයන්ගේ හා අනුයෝජිතයන්ගේ අයිතිවාසිකම්, බලතල, කර්තව්‍ය හා කාර්ය;

(ඉ) කමිටුවේ රැස්වීම්, සංස්ථාවේ සාමාජිකයන්ගේ වාර්ෂික මහා සභා රැස්වීම හා විශේෂ මහා සභා රැස්වීම් කැඳවීම හා පැවැත්වීම;

(ඊ) සංස්ථාවේ දේපළ කළමනාකරණය කිරීම හා අරමුදල් වල භාරකාරත්වය;

(උ) වෘත්තීය ක්‍රියා පැවැත්වීම පිළිබඳ සංග්‍රහයක් සකස් කිරීම; සහ

(ඌ) විනය පරීක්ෂණය පිළිබඳ කාර්ය පරිපාටිය.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් නීතියක් (1) වන උපවගන්තිය යටතේ සාදන ලද නීතියක් පරිදි එවැනිම රැස්වීමක දී හා එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට ඉහතින් වූ දිනයේ දී බලාත්මකව පැවති සංගමයේ මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධාන හා නීති අනුකූල නොවන තාක් දුරට, මේ පනත යටතේ සාදනු ලැබූ නීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සියලුම සාමාජිකයෝ, සංස්ථාවේ තත් කාලයෙහි බලපවත්නා රීතිවලට යටත් විය යුත්තා හ.

සංස්ථාවේ මුද්‍රාව

**7.** සංස්ථාවේ මුද්‍රාව, ගරු ප්‍රධාන ලේකම්වරයා භාරයෙහි තිබිය යුතු අතර, මුද්‍රාව කමිටුව විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් එය වෙනස් කරනු ලැබිය හැකි ය. ඒ මුද්‍රාව කමිටුවේ අනුමැතිය ඇතිව හා කමිටුවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු ය. ඒ සාමාජිකයන් දෙදෙනාම තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඒ සාධන පත්‍රයට තම නම් අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරන ලද අත්සන් කිරීමකට බාහිරව විය යුතු ය.

සංස්ථාවේ අරමුදල

**8.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව වෙනුවෙන් ත්‍යාගයක්, රික්තවරණ පැවරීමක්, පරිත්‍යාගයක්, සම්මාදම් මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් මින් පෙර ලැබුණු හෝ මින් මතු ලැබෙන සියලු මුදල් කමිටුව විසින් නිශ්චය කරනු ලබන පරිදි එක් බැංකුවක් හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාව විසින්, සංස්ථාවේ දේපළ පුනරුත්ථාපනය කිරීම, වැඩිදියුණු කිරීම හා සංවර්ධනය කිරීම පිණිස යම් ක්ෂය අරමුදලක්, සංචිත හෝ නිධන් අරමුදලක් ඇති කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත යටතේ සංස්ථාවේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කාර්ය ඉටු කිරීමේ දී හා කර්තව්‍ය කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද වියදම් කිසිවක් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ මුදල් හා දේපළ, මෙහි දක්වා ඇති පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම අරභයා පමණක් යොදවනු ලැබිය යුතු අතර, එයින් කවර හෝ කොටසක්, කෙළින්ම හෝ අන්‍යාකාරයකින්, සංස්ථාවේ සාමාජිකයන් වෙත ලාභාංශ වශයෙන්, ප්‍රසාද මුදල් වශයෙන් හෝ අන්‍යාකාරයකින් ගෙවීම හෝ පැවරීම කරනු නොලැබිය යුතු ය.

ගිණුම් හා විගණනය

**9.** (1) භාණ්ඩාගාරිකවරයා විසින්, කමිටුවේ අධීක්ෂණය යටතේ, සංස්ථාවේ විගණනය, ආදායම හා වියදම පිළිබඳව නිසි ගිණුම් පොත් තබා ගැනීමට සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම් සෑම වර්ෂයකට ම යටත් පිරිසෙයින් එක් වරක් හෝ පරීක්ෂා කොට විගණනය කරනු ලැබිය යුතු අතර, ආදායම හා වියදම පිළිබඳ ගිණුමේ ශේෂ පත්‍රයේ නිරවද්‍යතාව පිළිබඳව කමිටුව විසින් පත් කරනු ලබන විගණකවරුන් විසින් සහතික කරනු ලැබිය යුතු ය.

සංගමය විසින් ගෙවිය යුතු හා සංගමයට අයවිය යුතු ණය

**10.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට ඉහතින් වූ දිනයේ පැවති සංගමයේ සියලු ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, ඒ දිනයේ දී සංගමයට අය විය යුතු සියලු ණය සහ සංගමයට ගෙවිය යුතු සියලු සම්මාදම් මුදල් හා දායක මුදල්, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

විසුරුවා හැරීමේදී ඉතිරි වන දේපළ

**11.** මහා සභා රැස්වීමක දී හෝ විශේෂ මහා සභා රැස්වීමක දී පැමිණ සිටින සාමාජිකයින්ගෙන් 3/4 බහුතරයෙන් සංස්ථාව විසුරුවා හරිනු ලැබුවහොත්, එහි සියලු ණය හා බැරකම් ගෙවා පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වේ නම්, ඒ දේපළ, සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා හරිනු නොලැබිය යුතු අතර, එම දේපළ ක්‍රීඩා අමාත්‍යාංශයට හෝ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට හෝ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හරින අවස්ථාවේ දී හෝ එසේ විසුරුවා හැරීමට කලින්, ඒ කවරෙකුටදැයි සංස්ථාවේ සාමාජිකයන් විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

**12.** මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම් වලට හැර, ජනරජයේ හෝ රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**13.** මේ පනතේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.